# සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථාන වලින් කුඩා ඉඩම් හිමියන්ට ලැබෙන ආර්ථික වාසි

**කේ. එස්. පීරිස් විසිනි**

(කුඩා ඉඩම් දෙපාර්තමේන්තුව)

ශ්‍රී ලංකාවේ කුඩා රබර් ඉඩම් හිමියන්ගෙන් වැඩි දෙනෙකුට උසස් වර්ගයේ ෂීට් රබර් නිශ්පාදනය වැඩි කිරීමට හා දියුණු කිරීමට නොහැකිවීමේ හේතුව, ඒ සඳහා අවශ්‍ය මූලික පහසුකම් සපයා ගැනීමට තරම් ප්‍රමාණවත් ආර්ථික පසු බිමක් ඔවුන්ට නොමැතිවීමයි. අවශ්‍ය මූලික පහසුකම් පිළිබඳ මෙම ප්‍රශ්ණය, කුඩා ඉඩම් හිමියන් වැඩි වශයෙන් සිටින ප්‍රදේශවල, සමූහ සැකසුම් මධ්‍යස්ථාන පිහිටු වීමෙන් විසඳීමට පියවර ගෙන තිබේ. කුඩා ඉඩම් හිමියන් විසින් සපයනු ලබන අමුකිරි වලින් උසස් වර්ගයේ ෂීට් රබර් නිශ්පාදනය කිරීමත්, ඒවා අලෙවි කිරීමත්, කරනු ලබන පොදු මධ්‍යස්ථානය, සමූහ සැකසුම් මධ්‍යස්ථානය යනුවෙන් හඳුන්වනු ලැබේ. එවැනි මධ්‍යස්ථානයක කටයුතු පවත්වාගෙන යාම සඳහාත්, පාලනය සඳහාත්, කිරි සපයනු ලබන කුඩා ඉඩම් හිමියන්ගෙන් සමන්විත සමිතියක් ද තිබේ.

## පොදු පරමාර්ථය

කුඩා රබර් ඉඩම් හිමියන්ගේ ෂීට් රබර් නිශ්පාදනයේ තත්ත්වය උසස්කර, ඔවුන්ගේ රබර් සඳහා වැඩි මුදලක් ලබා දීමත්, වැඩි වැඩියෙන් විදේශ මුදල් උපයා ගැනීමත්, මෙම වැඩ පිළිවෙලේ පොදු පරමාර්ථයයි. මෙම පරමාර්ථයෙන් යුතුව, ශ්‍රී ලංකා රජයේ මුදල් ආධාර හා අනුග්‍රහය ඇතිව, ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය මගින් සමූහ සැකසුම් මධ්‍යස්ථාන පිහිටුවීමේ වැඩ පිළිවෙල ක්‍රියාත්මක කරනු ලැබේ.

## ලැබෙන ආදයම වැඩිවීම

සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථාන වලට සම්බන්ධවීමෙන්, තමන් විසින්ම නිශ්පාදනය කිරීමෙන් ලැබෙන ආදයමට වඩා වැඩි ආදයමක් ලැබිය හැකිය. මෙම කරුණ පහත සඳහන් සරල උදාහරණයෙන් පැහැදිලි කළ හැකිය. කුඩා ඉඩම් හිමියෙකු තම නිශ්පාදනයේ තත්වය අනුව, එය සාමාන්‍යයෙන් විකුණන ලද්දේ ආර්.එස්.එස්. නො. 3 මිළට යයිද, සමූහ සැකසුම් මධ්‍යස්ථානයක් මගින් නිශ්පාදනය කොට, එය සාමාන්‍යයෙන් විකුණන ලද්දේ ආර්.එස්.එස්. නො. 1 මිළට යයිද සිතමු. එවිට ආර්.එස්.එස්. නො. 1 හා ආර්.එස්.එස්. නො. 3 අතර ඇති මිළේ වෙනසට කිට්ටු ප්‍රමාණයකින් වැඩිපුර මුදලක් ලබාගත හැකිවේ. එසේ වැඩිපුර ලැබිය හැකි මුදල කොපමණද යන්න එදිනෙද පවත්නා මිළ ගණන් පරික්ෂාකර බැලීමෙන් පහසුවෙන් නිගමනය කරගැනීමට පුළුවන. මලයාසියාවේ කුඩා ඉඩම් හිමියන් සමූහ සැකසුම් මධ්‍යස්ථානවලට සම්බන්ධවී, උසස් වර්ගයේ රබර් නිශ්පාදනය කොට වැඩි ආදයම් ලැබීම, මෙරට කුඩා ඉඩම් හිමියන්ද සැළකිල්ලට ගැනීම වටී. මෙම ක්‍රමය මලයාසියාවේ ඉතාමත් සාර්ථක ප්‍රතිඵල ලබා තිබීම මෙහිලා අප දිරි ගැන්වීමට හේතුවී තිබේ.

## නිශ්පාදන වියදම් දරන්නට සිදු නොවීම

කුඩා රබර් ඉඩම් හිමියන් තමන් විසින් ෂීට් රබර් නිශ්පාදනය කිරීමේදී, නිශ්පාදන කටයුතු වලට අවශ්‍ය රසායන ද්‍රව්‍ය සඳහාත්, නිශ්පාදන පහසුකම් සඳහාත්, වියදම් දැරිය යුතුවේ. එහෙත් සමූහ සැකසුම් මධ්‍යස්ථාන ක්‍රමය යටතේ මධ්‍යස්ථානය මගින් නිශ්පාදන කටයුතු හා අලෙවි කටයුතු කරන නිසා, කුඩා ඉඩම් හිමියන් විසින් එවැනි වියදම් දැරිය යුතු නොවේ. නිශ්පාදනය අලෙවි කොට නිශ්පාදන වියදම මධ්‍යස්ථානය මගින් අයකරගනු ලැබේ. මෙහි ඇති ඉතාමත් වැදගත් කාරණය වන්නේ, කුඩා ඉඩම් හිමියන්ට එදිනෙද නිශ්පාදන කටයුතු වලදී, මුහුණ දීමට සිදුවන දුෂ්කරතාවයන්ගෙන් නිදහස් වීමත් එසේ දැරිය යුතු වූ වියදම තමන් වෙතම රඳවා ගැනීමෙන් සිදුවන වාසියත්ය.

## වෙනත් ආදයම් මාර්ගවල යෙදීය හැකිවීම

සමූහ සැකසුම් මධ්‍යස්ථානවලට සම්බන්ධවූ පසු පෙරදී නිශ්පාදන කටයුතු සඳහා යෙදවීමට සිදුවූ කාලය ඉතිරි වේ. කුඩා ඉඩම් හිමියන් විසින් කළ යුතු එකම දෙය තම තමන්ගේ අමුකිරි

පිරිසිදුව මධ්‍යස්ථානය වෙත සැපයීම පමණක් නිසා ඉන් පසු ඉතිරිවන කාලය ඔවුන්ට වෙනත් කටයුතු සඳහා යෙදිය හැකිය. කුඹුරු වැඩ කරන කුඩා ඉඩම් හිමියාට ඒ සඳහා එම කාලය මිඩංගු කළ හැක. ගෙවතු වගා කරන කුඩා ඉඩම හිමියාට එම කාලය ඒ සඳහා යෙදිය හැක. වෙනත් ආදායම් මාර්ගයන්හි නිරත වන කුඩා ඉඩම් හිමියන්ටද එම කටයුතු වල යෙදීමට කාලය ඉතිරි වේ. මේ ක්‍රමණ අන්දමට බැලුවත්, ඉතිරිවන කාලය වෙනත් ආදායම් මාර්ගවල යෙදීමෙන් කුඩා ඉඩම් හිමියන්ට වැඩි ආදායම් ලැබීමට ඉඩකඩ සපයයි.

## ආදායමින් නිසි ප්‍රයෝජන ගත හැකිවීම

සමූහ සැකසුම මධ්‍යස්ථානවල මුදල් ගෙවන ආකාරය අනුව, රබර් සඳහා ලැබෙන මුදල ප්‍රයෝජනවත් පරිදි යෙදවීමට අවස්ථා සැළසේ. සතිපතා සපයා ඇති රබර් ප්‍රමාණය අනුව අත්තිකාරම් ලබා ගැනීමට ද පුළුවන. එය එදිනෙද අවශ්‍යතාවන් සඳහා යෙදවිය හැකිය. අත්තිකාරම ගනු ලැබූ පසුද සමිතිය වෙත සැහෙන මුදල් ප්‍රමාණයක් ඉතිරි වේ. . එය මාසයක් අවසානයේදී ලබාගත හැකි අතර, එයද ප්‍රයෝජනවත් පරිදි යෙදවිය හැක. එමෙන්ම අත්තිකාරම නොගන්නා අවස්ථාවලදී මාසයේම රබර් සඳහා අයවිය යුතුව ඇති මුදල ලබාගෙන වඩාත් ප්‍රයෝජනවත් පරිදි එය පාවිච්චි කිරීමට පුළුවන. මෙය තමන් නිශ්පාදනය කොට එදිනෙද ලැබෙන මුදලින් ලබා ගන්නා ප්‍රයෝජනයට වඩා හැම අතින්ම ප්‍රයෝජනවත් වන්නේය.

## පාඩු වීදීම වැලැක්වීම

මේ ක්‍රමය යටතේ කුඩා රබර් ඉඩම් හිමියන්ට පුද්ගලික රබර් වෙළෙන්දගේ බලපෑමෙන් ද නිදහස් විය හැකි වන්නේය. වෙළෙන්ද ඉල්ලන මිළටම නිශ්පාදනය විකිණීමටත්, එයේ කොට පාඩු විදීමටත් සිදුවන්නේ නැත. එසේම අනාගත නිශ්පාදනය විකිණීමෙ අදහසින් ණයවීමටද, සිදු නොවේ. බොහෝවිට කුඩා ඉඩම හිමියන්ට, අලෙවි කිරීමේදී පැණ නගින අපහසුකම් මේ ක්‍රමය යටතේ මතු නොවේ.

## රබර් කට්ටිය දියුණු කරගත හැකිවීම

සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථානයන්ට අමුකිරි සැපයීම ආරම්භ කළ පසු, තමන්ගේ රබර් කට්ටියේ දියුණුව සඳහා වල් නෙළීම, කාණු, ගල්-වැටි දැමීම ආදී කටයුතු කළ හැක. මෙ මගින් වැඩි අස්වැන්නක් තම රබර් කට්ටියෙන් ලබා ගැනීම සඳහා නිසි පියවර ගැනීමට පුළුවන් වන නියා එයද වැඩි ආදායමක් ලබා දීමට හේතුවේ.

මෙවැනි ආර්ථික වාසි කීපයක් කුඩා ඉඩම හිමියන්ට ලැබෙන, සමූහ සැකසුම් මධ්‍යස්ථාන 28 ක් දැනටමත් ශ්‍රී ලංකාවේ රබර් වගා කරන ප්‍රදේශවල පිහිටුවා තිබේ. ආරම්භයේ සිට මෙම මධ්‍යස්ථාන පිහිටුවීමේදී ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ කුඩා ඉඩම දෙපාර්තමේන්තුව විශේෂ උත්සාහයකින් කටයුතු කර තිබේ. ඒවාට සම්බන්ධවීමෙන් තමන්ගේ ආදායම් වැඩිකර ගැනීමටද, විදේශ මුදල් උපයා දීමෙන් මෙරට සංවර්ධනය සඳහා උපකාරීවීමටද, කුඩා රබර් ඉඩම හිමියන්ට අවස්ථාව සැළසී තිබේ.